# ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගය

**ශ්‍රී ලංකා ජනරජය**

# ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගය

In collaboration with:

SDCSL

ESCAP
Economic and Social Commission for Asia and the Pacific

UNITED NATIONS
SRI LANKA

# හැඳින්වීම

දැඩි අර්බුදකාරී කාල පරිච්ඡේදයකින් පසු ආර්ථික පුනර්ජීවනය සඳහා ශ්‍රී ලංකා රජය සැලසුම් සකස් කරන බැවින් ශක්තිමත්, තිරසර සහ සාධාරණ ආර්ථිකයක් නැවත ගොඩනැගීම සඳහා අපේක්ෂා සහගත ප්‍රතිසංස්කරණ වෙත යොමු වෙමින් සිටියි. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, සැමට සමෘද්ධිය ලඟා කරගත හැකි වන උසස් තත්ත්වයේ සංයුක්ත වර්ධනයක් ඇති කිරීම සඳහා පෞද්ගලික අංශයේ හැකියාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමට මූලික වනු ඇත. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර යනු ධනාත්මක සමාජීය සහ පාරිසරික බලපෑමක් ජනනය කිරීම සඳහා වාණිජමය වශයෙන් ශක්‍යතාව සහිත ආකෘති භාවිතා කරන අරමුණු මත පදනම් වූ ව්‍යවසායන් වේ. හරිත ව්‍යාපාර සහ සමාජ ව්‍යවසායන්හි සිට අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සවිබලගන්වන සංයුක්ත ව්‍යාපාර ආකෘති දක්වා විහිදුණු විවිධ ආකාරයේ ව්‍යාපාර ඒවාට ඇතුළත් වේ. හිතැරදි පරිසර පද්ධතිවල සහාය ඇතිව සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට වර්ධනය වීමට සහ විශාල වෙනසක් ඇති කිරීමට හැකිය.

කෙසේ වුවද, සංයුක්ත සහ තිරසර ව්‍යාපාර දැනට සිය වර්ධනය සහ ඒවායේ බලපෑම සීමා කරන තීරණාත්මක බාධක වලට මුහුණ දෙයි. තොරතුරු, කුසලතා පුහුණුව, හවුල්කාරිත්වයන්, මූල්‍ය සහ විධිමත් පිළිගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිකම මෙම බාධක අතර වේ. පුරෝගාමී ශ්‍රී ලාංකික සංයුක්ත සහ තිරසර ව්‍යාපාර බොහෝමයක් හදිසි සංවර්ධන අවශ්‍යතා සඳහා සිය දායකත්වය උපරිම කර ගැනීමට දැඩි වෙහෙසක් දරයි.

මෙලෙස ක්‍රමයෙන් එල්ල වන අභියෝග වලට මුහුණ දීම සඳහා රජය විසින් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසමේ (ESCAP) තාක්ෂණික සහාය ඇතිව සහ පෞද්ගලික අංශයේ, දේශීය හා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජ සංවිධාන, ශාස්ත්‍රඥයින් සහ බුද්ධි මණ්ඩලවල අදහස් විමසමින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගය යන විස්තීර්ණ ජාතික උපාය මාර්ගය සකස් කර ඇත. මෙම උපායමාර්ගය, සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල හැකියාවට ඉඩ දීම සඳහා එකිනෙකට සම්බන්ධ වූ අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර පහක් කේන්ද්‍ර කරගත් පැහැදිළි රාමුවක් සපයයිඃ

1. ප්‍රධාන ධාරාවේ ආර්ථික සැලසුම් සහ අපනයන ප්‍රවර්ධන ප්‍රයත්නයන් තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර උසස් තත්ත්වයට පත් කිරීම සඳහා පැහැදිළි දැක්මක් සහ ප්‍රතිපත්තිමය මෙහෙයවීමක් ඇති කිරීම;

2. බෙහෙවින් අවධානය යොමු වූ සිදුවීම්, සම්මාන සහ මාධ්‍ය ව්‍යාපාර හරහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පිළිබඳ දැනුවත්භාවය සහ පිළිගැනීම ඉහළ නැංවීම;

3. ගැළපෙන පරිදි සකස් කරන ලද කුසලතා පුහුණුව, මෙවලම් කට්ටල සහ උපදේශන සේවා හරහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර හා රජයේ ආයතන යන දෙඅංශයෙහි ම හැකියාවන් ගොඩනැගීම;

4. වැඩිදියුණු කළ සොයාගැනීමේ හැකියාව සහ විනිවිදභාවය සඳහා බලපෑම් දත්ත, ජාත්‍යන්තර සහතික සහ ඩිජිටල් විසඳුම් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම;

5. නව්‍ය ආයෝජන උපකරණ සහ අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණ සමඟ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සම්බන්ධ කිරීමෙන් මුදල් යෙදවීමේ හිඩැස් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

රජයේ අමාත්‍යාංශ සහ ආයතන, ජාත්‍යන්තර හවුල්කරුවන්, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය හරහා වන සම්බන්ධීකරණ ප්‍රයත්නයන් මෙම උපාය මාර්ගයට ඇතුළත් වේ. අරමුණ සහ සහයෝගීතාවයේ මෙම එකමුතුව පුරෝගාමී සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවලට දියුණු වීමට, විසඳුම් ප්‍රතිනිර්මාණය කිරීම, දියුණුව ළඟා කර ගැනීම සහ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා තම දායකත්වය උපරිම කිරීමට හැකි සක්‍රීය පරිසර පද්ධතියක් නිර්මාණය කරනු ඇත.

උපාය මාර්ගයේ සංවර්ධනයට ගැඹුරු පසුබිම් අධ්‍යයනයක් ඉවහල් වූ අතර එයට ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා, කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා, වලංගු කිරීමේ වැඩමුළු සහ දැනට පවතින මූලාශ්‍ර මත සිදු කෙරෙන පර්යේෂණ ආකාරයෙන් පාර්ශවකරුවන් වෙතින් ලබාගත් අදහස් ඇතුළත් විය. මෙම අභ්‍යාසවල සොයාගැනීම් උපාය මාර්ගයේ දක්වා ඇති නිර්දේශ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙන අතර ඒවා වෙනත් පසුබිම් සටහනකින් ඉදිරිපත් කර ඇත.

අපේක්ෂා සහගත ප්‍රතිසංස්කරණ සිදුවෙමින් පවතින අතර සාධාරණ හා තිරසර වර්ධනයක් ඇති කිරීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල ගතිකත්වය උපයෝගී කර ගන්නා නව ආර්ථික සුසමාදර්ශයක් කරා යොමු වීම සඳහා ශ්‍රී ලංකාව තුළ වන අවස්ථාවක් උපාය මාර්ගයෙන් දක්වා ඇත. එමඟින් හදිසි සංවර්ධන අවශ්‍යතා සපුරාලීමේදී සහ සියලුම ශ්‍රී ලාංකිකයින් සඳහා දිගුකාලීන සමෘද්ධිය අත්කර ගැනීමේ දී පෞද්ගලික අංශයේ දක්ෂතාවය ඔප් නැංවීම සඳහා වන රජයේ කැපවීම පෙන්නුම් කරයි.

# ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගය

## I. හැඳින්වීම

1. 2030 තිරසර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට සහ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ගැළපෙන පරිදි පෞද්ගලික අංශය මූලික වන, සංයුක්ත සහ තිරසර ආර්ථික පරිවර්තනයක් සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටියි. මෙයට ආර්ථික විවිධාංගීකරණය දිරිගැන්වීම, නීලහරිත ආර්ථිකයක් සංවර්ධනය කිරීම, තාක්ෂණය මූලික වූ ප්‍රවේශයන් යොදාගැනීම, සමාජ සංයුක්ත බව සහතික කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. මීට සමගාමීව, දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, 2030 වන විට පුනර්ජනනීය බලශක්තිය සියයට 70 ක් ලබා ගැනීම සහ සමාජ සංවර්ධන අරමුණු සපුරාලීම ශ්‍රී ලංකා රජයේ අරමුණ වන අතර මෙහිදී 2030 වන විට ජනගහනයෙන් සියයට 8 කගේ දරිද්‍රතාවය අඩු කිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

2. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර යනු ප්‍රජාවන් සහ පරිසරය තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා හිතාමතා සහ අභිප්‍රායික ප්‍රවේශයක් ගන්නා අරමුණු මත පදනම් වූ ව්‍යවසායන් වේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මඟින් සමාජයට සහ පෘථිවියට ප්‍රතිලාභ ලබා දෙන අතරම තම තිරසර බව සහතික කරමින් ධනාත්මක සමාජීය සහ පාරිසරික බලපෑම් ඇති කිරීම සඳහා වෙළඳපළ පාදක ප්‍රවේශයන් භාවිතා කරනු ලැබේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට පාරිසරික වශයෙන් තිරසර ලෙස ක්‍රියාත්මක වන හරිත ව්‍යාපාර; ආර්ථික පිරමීඩය පත්ලේ සිටින පුද්ගලයන්ට වාණිජමය වශයෙන් ශක්‍ය පදනමක් මත භාණ්ඩ, සේවා සහ ජීවනෝපායන් සපයන සංයුක්ත ව්‍යාපාර ආකෘති; සමාජ ව්‍යවසායන්; කාන්තා කේන්ද්‍රීය සහ කාන්තා මූලික ව්‍යවසායන්; සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (කාන්තාවන්, තරුණයින් සහ ආබාධ සහිත පුද්ගලයින් වැනි) සඳහා යෝග්‍ය රැකියා සපයන ව්‍යාපාර ඇතුළත් වේ.

3. ජාතික සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසර ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. රාජ්‍ය වියදම් සඳහා වන මූල්‍ය සීමාවන්හි වර්තමාන සන්දර්භය තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි කාර්යභාරය විශේෂයෙන් තීරණාත්මක වේ.

4. දැනටමත්, ධනාත්මක පාරිසරික හා සමාජීය බලපෑම් ජනනය කරන සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා උදාහරණ කිහිපයක් ශ්‍රී ලංකාව තුළ පවතියි. මේවා ප්‍රතිනිර්මාණය කළ සහ වැඩිදියුණු කළ ව්‍යාපාර මත ගොඩනැගිය හැකිය. උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ: (අ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ සමාගම් වැනි පාරිසරික තිරසර බව කෙරෙහි ඉවහල් වන ව්‍යාපාර; (ආ) කුඩා වතු හිමි ගොවීන්ගේ සැපයුම් දාමය තුළ ඔවුන්ව ඒකාබද්ධ කිරීම සහ වටිනාකම් එකතු කිරීම සිදු කරන වාණිජ ව්‍යාපාර (ඇ) කුඩා වතු හිමි ගොවීන්ට තාක්ෂණික දැනුම, වෙළඳපළ අවස්ථාවන් සහ ජාත්‍යන්තරව පිළිගත් සහතික සපයන සමුපකාර කෘෂිකාර්මික ජාල (ඈ) කාන්තාවන්, තරුණයන් සහ වරප්‍රසාද නොලත් ප්‍රජාවන් සඳහා සාධාරණ රැකියා අවස්ථාවන් සහතික කරන සමාජ ව්‍යවසායන්; (ඉ) කාබන් විවික්ත කිරීම, ප්‍රති වන වගාව සහ පුනර්ජනනීය කෘෂිකර්මය වැනි පරිසර හිතකාමී භාවිතයන්ට සහාය දක්වන සමාජ ව්‍යවසායන්; සහ (ඊ) සංවිධිත සහාය සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපළ වෙත සහතික කළ ප්‍රවේශය පිරිනමමින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පෝෂණය කරන ව්‍යාපාර වර්ධනය සඳහා සම්පත් සපයන්නන් සහ වේදිකා. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේදී පුද්ගලික අංශයේ කාර්යභාරය වැඩි දියුණු කිරීම සඳහා මේ ආකාරයේ ව්‍යාපාර ප්‍රධාන ධාරාවේ ආර්ථික ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

5. ආර්ථික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව සහ ගෝලීය තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට අමතරව සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය කිරීම සහ ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ඒවා ජාතික ව්‍යාපාර, කාර්මික, මූල්‍ය සහ ආයෝජන ප්‍රතිපත්ති සමඟ ඒකාබද්ධ කිරීම මෙන්ම සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසරභාවය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවලට පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම අවශ්‍ය වේ.

6. මෙම උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලාංකික සහ ගෝලීය පරිසර පද්ධතිය තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. නවෝත්පාදනය දිරිමත් කිරීම, දැනුම බෙදා ගැනීම, ඉලක්කයක් සපුරා ගැනීමට අවශ්‍ය සම්පත් රැස් කර සකස් කිරීම සහ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල බලපෑම වර්ධනය කිරීම සඳහා හවුල්කාරිත්වයන් අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සහ මතුවෙමින් පවතින අභියෝග සහ අවස්ථාවන් අවබෝධ කර ගැනීමටත් මෙම උපාය මාර්ගයේ දක්වා ඇති පරිදි බලපෑම්සහගත මුලපිරීම් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට හවුල්කාරිත්වයන් උපයෝගී කර ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

7. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අභියෝග රැසකට මුහුණ දෙයි. ඒවා ක්‍රියාත්මක වන පුළුල් පරිසර පද්ධතියේ ලක්ෂණ (පවතින යටිතල පහසුකම්, වෙළඳපල සම්බන්ධතා සහ ව්‍යාපාරවල නියැලීමේ පහසුව වැනි) ඒ ආශ්‍රිත අභියෝගවලට

අමතරව සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සිය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා සලකා බැලිය යුතු සහ ආමන්ත්‍රණය කළ යුතු ඒවාට අනන්‍ය වූ අභියෝගවලටද මුහුණ දෙයි:

a) ආයෝජන/ණය දීමේ තීරණවල තිරසර සහ සංයුක්ත ප්‍රතිඵල සලකා බලන ස්කන්ධ හෝ ණය ඇතුළුව ප්‍රාග්ධනයට ඇති සීමිත ප්‍රවේශය, සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට ඒවායේ බලපෑම වැඩි කිරීමට ඇති හැකියාව අඩු කරන අතර අනෙකුත් ව්‍යාපාර මඟින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති යොදා ගැනීම වළක්වයි;

b) බලපෑම් මැනීම, ඇගයීම සහ වාර්තා කිරීම පිළිබඳ සීමිත දැනුමක් සහිත වීම යන්නෙන් අදහස් කරන්නේ බලපෑම් ආයෝජන ලබා ගැනීමට සහ ඇති කරන තිරසර සහ සංයුක්ත බලපෑමේ මට්ටම විශ්වසනීය ලෙස තීරණය කිරීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සතුව ප්‍රමාණවත් දත්ත නොමැති විය හැකි බවයි;

c) සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල විශේෂ තත්ත්වයෙහි විධිමත් පිළිගැනීම සීමිත වීම හේතුවෙන් ඒවාට එම තත්ත්වයේම පවතින ලාභය මත පදනම් වූ සාම්ප්‍රදායික පෞද්ගලික අංශයේ ව්‍යාපාර සමඟ තරඟකාරීත්වයක් ඇති වන අතර එමඟින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල සීමාවන් අඩු වන අතර එය ඒවායේ ලාභදායීතාවයට සහ දියුණුවට බලපායි;

d) සමාජීය හා පාරිසරික බලපෑම් වලට අදාළ සහතික සහ ප්‍රතීතන ලබා ගැනීම සහ පවත්වාගෙන යාමට අදාළ අධික පිරිවැය, තාක්ෂණික සංකීර්ණතා සහ භාෂාමය බාධක හේතුවෙන්, ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවේශ වීමේදී සහ ඒ තුළ තරඟ කිරීමේදී සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට, විශේෂයෙන් කුඩා සමාගම් වලට අවාසි සහගත තත්ත්වයක් ඇති වේ;

e) සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති යොදා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට ඉවහල් වන විශේෂිත ව්‍යාපාර පුහුණු සහ උපදේශන සේවා සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට ඇත්තේ සීමිත ප්‍රවේශයකි;

f) කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන සහ කාන්තාවන් කේන්ද්‍ර කරගත් ව්‍යවසායන් තම ව්‍යාපාර ස්ථාපිත කිරීමේ දී සහ වර්ධනය කිරීමේ දී බොහෝ විට ඒවාට අනන්‍ය වූ අභියෝගවලට මුහුණ දෙන ලදි.

8. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සහාය වීමට රජයේ උපාය මාර්ගවල ඵලදායීතාවය පහත පරිදි ඉහළ නැංවීමට අවස්ථාවක් ඇත:

a) සංයුක්ත ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීමේදී ව්‍යාපාර මුහුණ දෙන ප්‍රධාන බාධක සම්බන්ධයෙන් කටයුතු කරන පැහැදිලි සහ සම්බන්ධීකරණය කරන ලද රජයේ ප්‍රතිපත්ති මාලාවක් ස්ථාපිත කිරීම: පිළිගැනීම, ඉතා වැදගත් සහාය සේවා වෙත ප්‍රවේශය, හවුල්කාරිත්වයන් ගොඩනැගීම, බලපෑම මැනීම සහ කළමනාකරණය කිරීම සහ මූල්‍ය වෙත ප්‍රවේශය;

b) සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති සඳහා ජාතික සහ ජාත්‍යන්තර සහතික කිරීම, ප්‍රතීතනය හෝ ලියාපදිංචි කිරීමේ යෝජනා ක්‍රම පුළුල් කිරීම සහ ඒ සඳහා සහාය දීම;

c) ව්‍යාපාර ප්‍රවර්ධන ප්‍රතිපත්ති මඟින් ජාතික ආර්ථික, සමාජීය සහ පාරිසරික ඉලක්ක සපුරා ගැනීමට සහාය වන පරිදි, පවතින ව්‍යවසායකත්ව ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහන් තුළ සංයුක්ත සහ තිරසර භාවිතයන්, බලපෑම් මැනීම සහ වාර්තා කිරීම ඇතුළත් කිරීම;

d) සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශයේ ධාරිතාවන් සහ සම්පත් වැඩි දියුණු කිරීම;

e) සමාගම් වලට වඩාත් බලපෑම් සහගත ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීමට සහ බලපෑම් ආයෝජනය වෙත ප්‍රවේශ වීමට සහ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය සඳහා ප්‍රබල අවස්ථා ගොඩනැගීමට හැකි වන පරිදි බලපෑම් මැනීමේ සහ වාර්තා කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම;

f) ණය විකල්ප සහ ස්ත්‍රී පුරුෂ භාවයට අදාළ සාධක සලකා බලන ආයෝජන පුළුල් කිරීම, ද්විතීයික වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ බලපෑම් ආයෝජකයින් සඳහා කොටස් විකුණා ලාභ ලැබීමේ අවස්ථා ඉහළ නැංවීම මඟින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සහ දැරිය හැකි මූල්‍යකරණය වෙත ප්‍රවේශය පුළුල් කිරීම.

## II. දැක්ම

9. 2030 දී, ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදනය, පාරිසරික වගකීම සහ සමාජ ප්‍රගතිය සඳහා ප්‍රමුඛත්වය ගන්නා අතරම සමෘද්ධිමත්, ඔරොත්තු දීමේ හැකියාව සහිත සහ සාධාරණ ආර්ථිකයක් හැඩගැස්වීමට දායක වීම සඳහා පිළිගත් දියුණු වන සහ ගෝලීය වශයෙන් ගෞරවාදරයට පාත්‍ර වූ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අංශයක් පවතිනු ඇත.

## III. අරමුණු

10. ඉහත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා ඒවායේ දායකත්වය හඳුනා ගෙන ඒවා වැඩි දියුණු කිරීම සඳහා වර්තමාන ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කර ඇත.

11. වර්තමාන උපායමාර්ගය මඟින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන ආකාරයෙන් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා වන රජයේ සහාය සහතික කිරීම අරමුණු කර ගෙන ඇති අතර සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසරභාවය දිරිමත් කරන ගුණාත්මක හා ඉහළ වටිනාකමක් ඇති වර්ධනයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම උපාය මාර්ගය මඟින් නීතිමය සහ නියාමන රාමු හරහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය, දේශීය හා ගෝලීය සැපයුම් දාමයන් සමඟ ඒකාබද්ධ වීම සඳහා ධාරිතා සංවර්ධනය, දේශීය හා ගෝලීය පිළිගැනීම, හවුල්කාරිත්වයන්, බලපෑම් මැන බැලීම හා වාර්තා කිරීම සහ මූල්‍ය සඳහා වැඩිදියුණු කළ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සඳහා පැහැදිළි ක්‍රියාමාර්ග මාලාවක් සපයනු ලැබේ.

12. ක්‍රියාමාර්ග පහත සඳහන් කේන්ද්‍රීය ක්ෂේත්‍ර යටතේ වර්ගීකරණය කරනු ලැබේ:

- ■ දැක්ම සහ මෙහෙයුම
- ■ දැනුවත් කිරීම සහ පිළිගැනීම
- ■ ධාරිතා සංවර්ධනය
- ■ තොරතුරු වෙත ප්‍රවේශය සහ බලපෑම් වාර්තාකරණය
- ■ මූල්‍ය සහ දිරිගැන්වීම් වෙත ප්‍රවේශය

## IV. ක්‍රියාමාර්ග

**අ. දැක්ම සහ මෙහෙයුම: සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය සඳහා මෙහෙයවීම**

13. වත්මන් උපායමාර්ගය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පිළිබඳ ප්‍රතිපත්තියක් බවට වැඩිදියුණු කිරීම. වර්තමාන උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ලේඛනය 2030 වන විට ලඟා කරගත යුතු නිශ්චිත ඉලක්ක සහිත කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ප්‍රතිපත්තියක් බවට වැඩිදියුණු කිරීම.

14. ශ්‍රී ලංකාවට සංයුක්ත සහ තිරසර අපනයන හා ආයෝජන මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම. ජාතික ක්‍රියාකාරී සැලැස්මේ අනිවාර්ය අංගයක් ලෙස, ශ්‍රී ලංකාව සංයුක්ත සහ තිරසර නිෂ්පාදන සහ අපනයන සඳහා ප්‍රමුඛ කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීමේ හා බලපෑම සහ තිරසර සංවර්ධන අරමුණු කේන්ද්‍ර කර ගත් ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මාර්ග සිතියමක් නිර්මාණය කිරීම. මෙම මාර්ග සිතියමට පහත ක්‍රියාමාර්ග ඇතුළත් වනු ඇත: එහි දිශාව මෙහෙයවීම සඳහා බහු පාර්ශ්වකරුවන්ගේ මුලපිරීමක් සිදු කිරීම; සංයුක්ත සහ තිරසර ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා අවම සම්මත රාමුවක් නියම කිරීම; ජාතික අපනයන උපාය මාර්ගය සම්පූර්ණ කරන "සංයුක්ත සහ තිරසර ශ්‍රී ලංකාව" යන සන්නාමය ප්‍රවර්ධනය කිරීම; ගෝලීය තිරසරභාවය සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීමේ හැකියාව වැඩි දියුණු කිරීම; සහ බලපෑම් ආයෝජන සහ තිරසර සංවර්ධන අරමුණු කේන්ද්‍ර කරගත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා උපාය මාර්ග සකස් කිරීම.

**ආ. දැනුවත්භාවය සහ පිළිගැනීම: සංයුක්ත හා තිරසර ව්‍යාපාරයන් විසින් ගෙන එන ආර්ථික හා සංවර්ධන බලපෑම පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම හා සංයුක්ත සහ තිරසර සංවර්ධනයට සහාය වීම සඳහා සංයුක්ත හා තිරසර ව්‍යාපාරයන් දරන උත්සාහයන් හඳුනා ගැනීම**

15. **සාර්ථකත්වය පිළිබඳ දේශීය අත්දැකීම් හඳුනා ගැනීම.** හොඳම ප්‍රතිඵල ලබා ඇති සංයුක්ත සහ තිරසර ව්‍යාපාර හා සංයුක්ත සහ තිරසර භාවිතයන් පෙන්නුම් කර ඇති අංශවල පැතිකඩ නිර්මාණය කර මෙම පැතිකඩ සහ ජයග්‍රහණ සමාජ මාධ්‍ය, රූපවාහිනී වැඩසටහන් සහ ව්‍යාපාරික සිදුවීම් ඔස්සේ ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රවර්ධන සහ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් හරහා ප්‍රචාරය කිරීම. කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර සහ කාන්තාවන් කේන්ද්‍ර කරගත් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රදර්ශනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම.

16. **ජාතික සම්මාන ඉහළ නැංවීම.** දැනට පවතින ජාතික ව්‍යාපාර සම්මාන සමඟ උපායමාර්ගික සහයෝගීතාවය තුළින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල පිළිගැනීම, උනන්දුව සහ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම. මෙම සම්මානවල විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ සම්මානලාභීන්ට ජාත්‍යන්තර වෙළඳපොළ සහ මූල්‍යකරණ අවස්ථා වෙත වඩාත් ඵලදායී ලෙස ප්‍රවේශ වීමට හැකි වන පරිදි පවතින නිර්ණායක ගෝලීය ප්‍රමිතීන් සමග පෙළ ගැස්වීම.

17. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංසදය. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා ව්‍යාපාරික අවස්ථා සහ ජාතික ආර්ථික, සමාජීය සහ පාරිසරික ඉලක්ක සපුරා ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ලබා දෙන දායකත්වය පිළිබඳව දැනුවත් කිරීම; සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ දැනුම බෙදා ගැනීම; ඇති වන අවස්ථා තක්සේරු කිරීම; බලපෑම් ආයෝජන සහ තිරසර ආයෝජන උපකරණ ප්‍රවර්ධනය කිරීම; හා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා සාමූහික කැපවීමක් ඇති කිරීම සඳහා ව්‍යාපාර, ප්‍රමුඛ ජාතික සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩල, ව්‍යාපාරික ජාල, ආයෝජකයින්, සංවර්ධන හවුල්කරුවන් සහ රජයේ ආයතන සමඟ වාර්ෂික බහු පාර්ශවකරුවන්ගේ සංසදයක් සංවිධානය කිරීම. මෙම සංසදය මඟින් කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන සහ කාන්තා කේන්ද්‍රීය වූ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පැහැදිලිවම සම්බන්ධ කරනු ඇති අතර අනාගත ආයෝජකයින් සමඟ කටයුතු කිරීමට ඔවුන්ට සහාය වනු ඇත.

**ඇ. ධාරිතා සංවර්ධනය: සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර සහ රාජ්‍ය ආයතනවල ධාරිතාවන් වර්ධනය කිරීම**

සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා ධාරිතා වර්ධනය

18. **සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල හැකියාවන් වර්ධනය කිරීම සඳහා මාර්ග සිතියමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු ආයතනයක් පත් කිරීම.** ඊනෑම ව්‍යුහාත්මක සහ ධාරිතා හිඩැසක් පිරවීම ඇතුළුව එහි විධි නියෝගය, විෂය පථය සහ ධාරිතාවන් සමාලෝචනය කිරීමෙන් පසුව, කර්මාන්ත අමාත්‍යාංශය සහ තිරසර සංවර්ධන සභාව ඇතුළු අනෙකුත් කොටස්කරුවන් සමඟ හවුල්කාරිත්වයෙන්, රජයේ ආයතන සහ ව්‍යාපාර යන දෙකටම සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල ධාරිතාවන් වර්ධනය කිරීම සඳහා මාර්ග සිතියමක සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු ප්‍රමුඛ රාජ්‍ය ආයතනය ලෙස ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) වෙත පැවරීම. මෙම මාර්ග සිතියම මඟින් තිරසර ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර අතරත් එවැනි ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන සහ රාජ්‍ය ආයතන අතරත් ධාරිතා පවතින පරතරයන් හඳුනා ගැනීම; මෙම ක්ෂේත්‍රවල දැනට පුහුණුව සපයන සහ ධාරිතා වර්ධනය කරන ආයතන සහ සංවිධාන හඳුනා ගැනීම; සහ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සහාය දැක්වීමට ව්‍යාපාර පුහුණුව සහ සංවර්ධන සේවාවන් පිරිනැමීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම (පුහුණු වැඩසටහන්, ඉගැන්වීමේ විෂය මාලාවන් සහ මෙවලම් කට්ටල ඇතුළුව) සිදු කරනු ඇත.

19. **රජය විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් කෙරෙහි නැවත අවධානය යොමු කිරීම.** බලපෑම් ව්‍යාපාර ආකෘති සංවර්ධනය; ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශ්ලේෂණය; බලපෑම් මැන බැලීම සහ කළමනාකරණය; බලපෑම් වාර්තාකරණය; බලපෑම් ආයෝජනය සඳහා සූදානම; වෙළඳපොළ වෙත ප්‍රවේශය; තිරසර, කාබනික සහ වගකිවයුතු සහතික වෙත ප්‍රවේශය; හා වැඩිදියුණු කළ සමාගම් තිරසරභාවය සහ චක්‍රීය නිෂ්පාදන සැලැස්ම වැනි සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා තීරණාත්මක හැකියාවන් වර්ධනය කිරීම ඇතුළුව ජාතික සංවර්ධන ඉලක්කවලට සහාය වීම සඳහා පවතින රජය විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායක සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් නැවත සකස් කර යාවත්කාලීන කිරීම. කාන්තා ව්‍යවසායකයින් මුහුණ දෙන විශේෂිත අභියෝගවලට මුහුණ දීමට සහ කාන්තා ව්‍යවසායකයින් අතර මූල්‍ය හැකියාව ගොඩනැගීමට උපකාරී වන නිශ්චිත මුලපිරීම් සිදු කිරීම.

**20. රජයේ ආයතන වලින් ඔබ්බට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වෙත විශේෂිත පුහුණු සේවා පිරිනැමීම ඉහළ නැංවීම**. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීමට සහ පුළුල් කිරීමට අපේක්ෂා කරන ව්‍යාපාර සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ ඒවාට ගැළපෙන ව්‍යාපාර පුහුණු සකස් කිරීම සඳහා පෞද්ගලික සංවිධාන, සංවර්ධන හවුල්කරුවන්, ව්‍යාපාරික සංගම් සහ අධ්‍යයන ආයතන සමඟ කටයුතු කිරීම. බලපෑම් ව්‍යාපාර ආකෘති සංවර්ධනය; ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශ්ලේෂණය; බලපෑම් මැන බැලීම සහ කළමනාකරණය; බලපෑම් වාර්තාකරණය; බලපෑම් ආයෝජනය සඳහා සූදානම; බලපෑම් ආයෝජන අවස්ථා; වෙළඳපොළ වෙත ප්‍රවේශය; තිරසර, කාබනික සහ වගකිවයුතු සහතික වෙත ප්‍රවේශය; සහ වැඩිදියුණු කළ සමාගම් තිරසරභාවය සහ චක්‍රීය නිෂ්පාදන සැලසුම මෙම වැඩසටහන් වලට ඇතුළත් විය හැකිය.

**රාජ්‍ය ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම**

21. **සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට රජයේ හැකියාවන් වර්ධනය කිරීම වගකිව යුතු ආයතනයක් වෙත පැවරීම.** ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) අදාළ අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර දේශීය හා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය අංශයේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහනක් සකස් කළ යුතුය. මෙම වැඩසටහන මඟින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂා කරන වැඩසටහන් ද ඇතුළුව විවිධ ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් විසින් සපයනු ලබන පුහුණුව ලබා දෙනු ඇත: (අ) මනෝ විභිතීන් (mindsets) ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයන්ගෙන් වෙනස්වීම්/ප්‍රතිඵල පාදක ප්‍රවේශයන් වෙත මාරු කිරීම; (ආ) වෙනස්වීම් පිළිබඳ න්‍යායන් සංවර්ධනය කිරීම, ප්‍රතිඵල සහ බලපෑම් හඳුනා ගැනීම සහ පොදු මුලපිරීම්වල බලපෑම නිවැරදිව ඇගයීමට උසස් තත්ත්වයේ දත්ත සහිත ශක්තිමත් දර්ශක තෝරා ගැනීම සඳහා හැකියාවන් ගොඩනැගීම; (ඇ) සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීම සඳහා කුසලතා වර්ධනය කිරීම;

22. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීමට උපදේශන සේවා ලබා ගැනීම. ප්‍රතීතන පද්ධති, සමාජීය සහ හරිත ප්‍රසම්පාදනය, බලපෑම් ආයෝජනය සහ තිරසර සංවර්ධන ප්‍රවර්ධනය සඳහා ආයෝජන වැනි සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා රජයේ ආයතනවලට ඉතා වැදගත් මඟ පෙන්වීමක් ලබා ගැනීම හා රාමු සහ මෙවලම් කට්ටල සංවර්ධනය කිරීම.

**ඈ. තොරතුරු වෙත ප්‍රවේශය සහ බලපෑම් වාර්තාකරණය: බලපෑම් මැනීම සහ වාර්තා කිරීම සඳහා සහාය වන තොරතුරු වෙත වැඩි ප්‍රවේශයක් ලබා දීම.**

23. **තිරසරභාවය සහ සංයුක්ත බව යන අංග වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම.** සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, විශේෂයෙන් මධ්‍යම ප්‍රමාණයේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සහතික කිරීමේ සහ ප්‍රතීතන ක්‍රියාවලියේ පිරිවැය විධිමත් කිරීම, සරල කිරීම සහ අඩු කිරීම සඳහා Fair Trade International, World Fair Trade Organization" B Corp සහ European Chemical Agency ඇතුළු ප්‍රසිද්ධ සහතික කිරීමේ ආයතන සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම. ඊට සමගාමීව, එවැනි ක්‍රියාවලීන් අනුගමනය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා මූල්‍ය ආධාර සැපයීම.

24. **සහභාගීත්ව ඇපකර පද්ධති භාවිතය දිරිමත් කිරීම.** පවතින අත්දැකීම් මත තෝරාගත් අංශවල ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා සහභාගීත්ව ඇපකර පද්ධතියක් භාවිත කිරීම සඳහා දිරිදීමනා පිරිනැමීම. මෙම අඩු වියදම්, දේශීය වශයෙන් පදනම් වූ තත්ත්ව සහතික කිරීමේ ක්‍රමය, සංයුක්ත සහ තිරසර ව්‍යාපාර එකඟ වූ ප්‍රමිතීන්ට අනුව ක්‍රියාත්මක වීම සඳහා සහාය වීමට සහ පරීක්ෂාකාරී වීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, පාරිභෝගිකයින්, ග්‍රාමීය උපදේශකයින් සහ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරී සහභාගීත්වය මත පදනම් වූ සමාජීය පාලනය සහ දැනුම ගොඩනැගීම කෙරෙහි දැඩි අවධානය යොමු කරයි. සහභාගීත්ව ඇපකර පද්ධතිය විනිවිදභාවය සහ ගුණාත්මකභාවය සහතික කරන අතර සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට සහතික, ප්‍රතීතන සහ/හෝ ලියාපදිංචිය ලබා ගැනීමට උපකාරී වේ.

25. **බලපෑම් වාර්තාකරණයට සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම. මෙම උපාය මාර්ගයේ ප්‍රගතිය තීරණය කිරීම** සඳහා රජයට අවශ්‍ය දත්ත ඇතුළුව ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් නව මූලපිරීම් දියත් කිරීම, සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සහ පොදු ව්‍යාපාර සංවර්ධන වැඩසටහන්වල බලපෑම් දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම. මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය පිළිබඳව අර්ධ වාර්ෂිකව වාර්තා කිරීමේ වගකීම තිරසර සංවර්ධන සභාව සතු වේ.

26. **තාක්ෂණය භාවිතයෙන් සැපයුම් දාම සොයාගැනීමේ හැකියාව/විනිවිදභාවය වැඩි දියුණු කිරීම.** බලපෑම් නිරීක්ෂණය සහ වාර්තාකරණය සඳහා තාක්ෂණය මත පදනම් වූ සොයාගැනීමේ හැකියාව සහ විනිවිදභාවය පිළිබඳ විසඳුම් යොදා ගන්නා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සහාය වීම, ප්‍රවර්ධනය කිරීම සහ හඳුනා ගැනීම. බලපෑම් වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා දත්ත සහ දැනුම බෙදා ගැනීමට එවැනි සංයුක්ත සහ තිරසර ව්‍යාපාර දිරිමත් කිරීම. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, තාක්ෂණ හවුල්කරුවන් සහ විශේෂඥයින් සමග සාකච්ඡා කර, තාක්ෂණය මත පදනම් වූ සොයාගැනීමේ හැකියාව/විනිවිදභාවය පිළිබඳ විසඳුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ඒවා යොදා ගැනීමට මුදල් සැපයීම සඳහා යාන්ත්‍රණ ගවේෂණය කිරීම ඇතුළුව, කර්මාන්තය පුරා ඒවා යොදා ගැනීමේ දිරිගැන්වීම් සහ අවස්ථා හඳුනා ගැනීම. මෙම ප්‍රයත්නයන් සැපයුම් දාම විනිවිදභාවය පිළිබඳ රෙගුලාසිවලට සහ යුරෝපීය දේශගුණික නීතියට අනුකූල විය යුතු අතර විශේෂයෙන් කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා අපනයන වලට අදාළව ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට උත්සාහ කළ යුතුය.

**ඈ. මූල්‍ය සහ දිරිගැන්වීම් වෙත ප්‍රවේශය: සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා වන මූල්‍යය වෙත ප්‍රවේශය ඉහළ නැංවීම**

27. **සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා මූල්‍යකරණ සහ ආයෝජන පරිසර පද්ධතිය වැඩි දියුණු කිරීම.** සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මුහුණ දෙන මූල්‍යකරණ හිඩැස් පියවා ගැනීමට උපකාරී වන අතිරේක මූල්‍ය උපකරණ සහ රෙගුලාසි ගවේෂණය කර සංවර්ධනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, ආයෝජන මණ්ඩලය සහ තිරසර සංවර්ධන සභාව විසින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල මූල්‍ය අවශ්‍යතා හඳුනාගෙන, පවතින මූල්‍යකරණ අවස්ථා සහ ආයෝජන උපකරණ (සම කොටස්, හරිත සහ සමාජ බැඳුම්කර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් වූ මූල්‍ය නිෂ්පාදන, ප්‍රදාන, සමූහ අරමුදල් රැස් කිරීම, කාබන් ණය, නිෂ්පාදන පසුව ලබා දෙන තෙක් මුදල් ලබා ගැනීමේ ගිවිසුම් (offtake agreements) මත ණය දීම ඇතුළුව) සහ දේශීය හා විදේශීය ආයෝජන සමඟ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සම්බන්ධ කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කරනු ඇත. සිල්ලර හා සංවර්ධන බැංකු, දේශීය හා ජාත්‍යන්තර සංවර්ධන ආයතන, බලපෑම් ආයෝජන අරමුදල් සහ ජාල, ව්‍යාපාර සහ පෞද්ගලික ස්කන්ධ අරමුදල් ඇතුළු ප්‍රධාන මූල්‍ය කොටස්කරුවන් සමඟ ඒකාබද්ධව මාර්ග සිතියම සංවර්ධනය කෙරෙන අතර සම්බන්ධීකරණ ප්‍රවේශයක් හරහා ක්‍රියාවට නංවනු ලැබේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මූල්‍ය සහ ආයෝජන අවස්ථා සමඟ සම්බන්ධ කිරීමේදී වාර්ෂික සංයුක්ත සහ තිරසර පෞද්ගලික අංශ සංසදය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇත.

28. **අවදානම් අඩු කිරීමේ යාන්ත්‍රණය (උදා: ඇපකර) සහ දව ද්විතීයික වෙළඳපොළ හඳුන්වා දීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජන වලින් ඉහළ නැංවීම.** පුද්ගලික ආයෝජන උපයෝගී කර ගැනීම සඳහා, මුදල් අමාත්‍යාංශය විසින් ISB සඳහා බලපෑම් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂ ඇපකර යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ඇති අතර, එම ඇපකරය ISB වල ධනාත්මක සමාජීය සහ පාරිසරික බලපෑම් මඟින් ජනනය වන දිගුකාලීන මූල්‍ය ඉතිරිකිරීම් සමඟ සම්බන්ධ කරනු ඇත. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, දේශීය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගයෙන්, ද්‍රවශීලතාවය ඇති කර බලපෑම් ආයෝජකයින්ට සිය කොටස් විකුණා ඉවත් වීම සඳහා පහසුකම් සපයන ද්විතියික වෙළඳපොළක් සංවර්ධනය කිරීමට හරිත හා සමාජීය පොදු වෙළඳ හුවමාරුවක් ස්ථාපිත කරනු ඇත.

29. **බහුස්ථර බලපෑම් ආයෝජන අරමුදල් වර්ධනය කිරීම.** මුදල් අමාත්‍යාංශය, දේශීය හා ජාත්‍යන්තර බලපෑම් ආයෝජකයින් සහ ජාත්‍යන්තර මූල්‍යකරණ සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගයෙන්, විවිධ ආයෝජන සඳහා යොදවන ප්‍රාග්ධන ප්‍රමාණයන් සම්බන්ධයෙන් කටයුතු කරමින්, ඩොලර් 25,000 සහ ඩොලර් මිලියන 2.5 අතර ආයෝජන අපේක්ෂා කරන පුළුල් පරාසයක කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට අරමුදල් ලබා ගැනීමේ හැකියාව ඇති වන පරිදි බලපෑම් ආයෝජන අරමුදල් නිර්මාණය කිරීමට නායකත්වය දෙනු ඇත.

## V. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

**ක්‍රියාත්මක කිරීම**

30. **ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා වන උපාය මාර්ගය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම** රඳා පවතින්නේ ශක්තිමත් සහයෝගීතාවයක් සහ බහු පාර්ශවකරුවන්ගේ හවුල්කාරීත්වයන් මතයි. සාමූහික විශේෂඥතාව සහ සම්පත් උපයෝගී කර ගැනීම සහ සක්‍රීය පරිසර පද්ධතියක් ගොඩනැගීම සඳහා රාජ්‍ය ආයතන අතර සහයෝගීතාවය, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන, ජාත්‍යන්තර සංවිධාන සහ ශාස්ත්‍රඥයින්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වනු ඇත. මෙම සහයෝගී ප්‍රවේශය මඟින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, දැනුම හුවමාරුව සහ රට පුරා තිරසර ව්‍යාපාරික භාවිතයන් යොදා ගැනීම ඉහළ නංවනු ලැබේ.

31. **පහත සඳහන් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු රජයේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතන ලෙස හඳුනාගෙන ඇති අතර** අමුණා ඇති ක්‍රියාත්මක කිරීමේ මිතිකයෙහි නිශ්චිත කාර්යභාරයන් තවදුරටත් විස්තර කර ඇත.

| කේන්ද්‍රීය ක්ෂේත්‍ර | අදාළ අමාත්‍යංශ | අදාළ බලධාරීන් සහ දෙපාර්තමේන්තු |
|---|---|---|
| දැක්ම සහ මෙහෙයුම | කර්මාන්ත අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය<br>කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | ජනාධිපති ලේකම් කාර්යාලය<br>අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය<br>තිරසර සංවර්ධන සභාව |
| දැනුවත් කිරීම සහ පිළිගැනීම | කර්මාන්ත අමාත්‍යාංශය<br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය<br>ජන සන්නිවේදන අමාත්‍යාංශය | තිරසර සංවර්ධන සභාව<br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>අපනයන සංවර්ධන මණ්ඩලය |
| ධාරිතා සංවර්ධනය | කර්මාන්ත අමාත්‍යාංශය<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුව<br>කාර්මික සංවර්ධන මණ්ඩලය<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| තොරතුරු වෙත ප්‍රවේශය සහ බලපෑම් වාර්තාකරණය | කර්මාන්ත අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br>ආයෝජන මණ්ඩලය<br>කාර්මික සංවර්ධන මණ්ඩලය |
| මූල්‍ය සහ දිරිදීමනා වෙත ප්‍රවේශය | මුදල් අමාත්‍යාංශය | තිරසර සංවර්ධන සභාව<br>ආයෝජන මණ්ඩලය<br>ශ්‍රී ලංකා මහ බැංකුව |

**අධීක්ෂණය**

32. **සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ මෙහෙයුම් කමිටුවක් පත් කිරීම හරහා උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ඇත.** තිරසර සංවර්ධන සභාව, ලේකම් කාර්යාලය ලෙස කටයුතු කරනු ඇති අතර එමඟින් මෙහෙයුම් කමිටු රැස්වීම් කැඳවීම, උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය සිදු කරනු ඇත.

33. **සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ මෙහෙයුම් කමිටුව පහත පරිදි ස්ථාපිත කරනු ලැබේ:**

| රාජ්‍ය | රාජ්‍ය නොවන |
|---|---|
| අධීක්ෂණය: ජනාධිපති ලේකම් කාර්යාලය<br><br>ලේකම් කාර්යාලය: තිරසර සංවර්ධන සභාව<br><br>රජයේ ප්‍රධාන අමාත්‍යංශවල නියෝජිතයන්:<br>මුදල් අමාත්‍යාංශය<br>කර්මාන්ත අමාත්‍යාංශය<br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය<br>කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | පුද්ගලික අංශයේ නියෝජිතයන්:<br>විශාල (ලංකා වාණිජ මණ්ඩලය)<br>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය)<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර (Good Market)<br>කාන්තාවන් (ශ්‍රී ලංකා කාන්තා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය)<br>UN Global Compact Network Sri Lanka (එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා ගෝලීය සංයුක්ත ජාලය)<br><br>බුද්ධි මණ්ඩල, විශ්ව විද්‍යාල ඇතුළු සිවිල් සමාජ නියෝජිතයන්, කොරෝනා (කොවිඩ්19) වසංගතය සම්බන්ධයෙන් කටයුතු කළ නියෝජිතයන්, සිවිල් සමාජ සංවිධාන, CSO Collective Sri Lanka නියෝජිතයන් සහ පරිසරයට අදාළ ඡත්‍ර සංවිධානවල (umbrella organizations) නියෝජිතයන්, එක්සත් ජාතීන්ගේ අදාළ ආයතනවල සහ සංවර්ධන හවුල්කරුවන්ගේ සංසඳ නියෝජිතයන් |

**සම්පත් වෙන් කිරීම**

34. මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකා රජය සම්පත් වෙන් කරනු ඇත.

35. තවද, මෙම උපායමාර්ගය ක්‍රියාවට නැංවීම සඳහා උපායමාර්ගයේ දක්වා ඇති උපායමාර්ගික මුලපිරීම් (සම) මූල්‍යකරණය සඳහා අවශ්‍ය සම්පත් ලබා ගැනීමට ද්විපාර්ශ්වික සංවර්ධන ආයතන, එක්සත් ජාතීන්ගේ සංවිධාන සහ බහුපාර්ශ්වික මූල්‍ය ආයතන ඇතුළු විවිධ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගීතාව සහ මූල්‍ය හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට අවශ්‍ය වේ.

**අධීක්ෂණය සහ වාර්තාකරණය**

36. මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය සහ ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් යාවත්කාලීන දත්ත සපයමින් ලබා ගෙන ඇති මූල්‍ය සම්පත්, ඉදිරි ජයග්‍රහණ සහ අභියෝග ඉස්මතු කිරීම සහ ප්‍රමුඛතා ක්‍රියාමාර්ග සහ උපාය මාර්ගයට සිදු කිරීමට අවශ්‍ය වෙනස්කම් යෝජනා ඇතුළත් අර්ධ වාර්ෂික වාර්තා තිරසර සංවර්ධන සභාව විසින් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

37. මෙහෙයුම් කමිටුව විසින් වාර්තා සමාලෝචනය කර සංයුක්ත සහ තිරසර ආර්ථික වර්ධනයක් ඇති කිරීමේදී විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩ වර්ධනය සහතික කිරීම සඳහා එහි අදහස් ලබා දෙනු ඇත.

ඇමුණුම : ක්‍රියාත්මක කිරීමේ මිතිකය

| කේන්ද්‍රීය ක්ෂේත්‍ර | ක්‍රියාමාර්ග | උප ක්‍රියාකාරකම් |
|---|---|---|
| දැක්ම සහ මෙහෙයුම | සංයුක්ත සහ තිරසර ව්‍යාපර සංවර්ධනය සඳහා මාවත සැකසීම | ■ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් බවට උපාය මාර්ගය වැඩිදියුණු කිරීම.<br>■ ශ්‍රී ලංකාවට සංයුක්ත සහ තිරසර අපනයන හා ආයෝජන මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම<br>■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර නීතිමය රාමුව සකස් කිරීම |
| දැනුවත් කිරීම සහ පිළිගැනීම | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පිළිබඳ දැනුවත්භාවය සහ පිළිගැනීම ඇති කිරීම | ■ සාර්ථකත්වය පිළිබඳ දේශීය අත්දැකීම් හඳුනා ගැනීම<br>■ ජාතික සම්මාන ඉහළ නැංවීම<br>■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංසදය |
| ධාරිතා සංවර්ධනය | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සහ රජයේ ධාරිතා වර්ධනය කිරීම | ■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සහ රජයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනයට මාර්ග සිතියමක් සකස් කිරීම<br>■ ව්‍යවසායක සහ ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් වෙත නැවත අවධානය යොමු කිරීම<br>■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල ධාරිතා වර්ධනය සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම<br>■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම |
| තොරතුරු වෙත ප්‍රවේශ වීම සහ බලපෑම් වාර්තාකරණය | තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීම සහ බලපෑම් වාර්තාකරණය සඳහා සහාය වීම | ■ තිරසරභාවය සහ සංයුක්ත බව යන අංග වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම<br>■ සහභාගීත්ව සහතික පද්ධති දිරිගැන්වීම<br>■ බලපෑම් වාර්තාකරණයට සහාය වීම සහ එය ප්‍රවර්ධනය කිරීම<br>■ සැපයුම් දාම සොයාගැනීමේ හැකියාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම |
| මූල්‍ය සහ දිරිදීමනා වෙත ප්‍රවේශ වීම | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම | ■ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා මූල්‍යකරණ සහ ආයෝජන පරිසර පද්ධතිය වැඩි දියුණු කිරීම<br>■ අවදානම් අඩු කිරීමේ යාන්ත්‍රණයන් හඳුන්වා දීම සහ ද්විතීයික වෙළඳපොළ සංවර්ධනය කිරීම මඟින් පුද්ගලික අංශයේ ආයෝජන වැඩි කිරීම<br>■ බහුස්ථර බලපෑම් ආයෝජන අරමුදල් සංවර්ධනය කිරීම |